මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2022 මැයි 12 |

# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2022 පෙබරවාරි

## සමස්ත නිරීක්ෂණ

අඛණ්ඩව නවවැනි මාසයටත් එ.ජ. ඩොලර් බිලියන 1.0ක් ඉක්මවූ අපනයන ඉපැයීම් සමඟ 2022 වසරේ පෙබරවාරි මාසයේ දී අපනයන ඉපැයීම්වල වර්ධනය දිගටම පැවතුණි. මේ අතර, 2022 වසරේ පෙබරවාරි මාසයේ දී ආනයන වියදම් පෙර මාසයට සාපේක්ෂව සුළු වශයෙන් අඩු වුවද, පසුගිය වසරේ පෙබරවාරි මාසයට වඩා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව වෙළඳ හිඟය පුළුල් විය. සංචාරක පැමිණීම් පෙර වසරේ අනුරූප  මාසයට සාපේක්ෂව 2022 වසරේ පෙබරවාරි මාසයේ දී කැපී පෙනෙන ලෙස යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කළේය. 2022 වසරේ පෙබරවාරි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ තවදුරටත් මන්දගාමී විය. මාසය තුළ දී, කොළඹ කොටස් වෙළඳපොළ වෙත ලැබුණු විදේශ ආයෝජනයන්හි ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. 2022 වසරේ පෙබරවාරි මාසය තුළ අන්තර් බැංකු වෙළඳපොළේ බර තැබූ සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකය එ.ජ. ඩොලරයට රුපියල් 202ක් පමණ විය. කෙසේ වෙතත්, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ පවතින ද්‍රවශීලතාව අඩුවීම මධ්‍යයේ විනිමය අනුපාතිකය මත ඇති වූ ඉහළ පීඩනය හේතුවෙන් විනිමය අනුපාතිකය ක්‍රමානුකූල ගැලපීමක් සඳහා මහ බැංකුව 2022 වසරේ මාර්තු මස පළමු සතියේ දී ඉඩ හැරිය ද වෙළඳපොළ බලවේග මඟින් ක්‍රමානුකූල ගැලපීමෙන් අපේක්ෂිත අවප්‍රමාණය වීමට වඩා විනිමය අනුපාතිකයෙහි ඉහළ අවප්‍රමාණය වීමක් ඇති කළේය.

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2021 පෙබරවාරි එ.ජ.ඩො. මිලියන | 2022 පෙබරවාරි එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2021 ජන. - පෙබ. එ.ජ.ඩො. මිලියන | 2022 ජන. - පෙබ. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 952 | 1,092 | 14.7 | 1,888 | 2,192 | 16.1 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 1,524 | 1,873 | 22.9 | 3,115 | 3,832 | 23.0 |
| වෙළඳ ශේෂය | -572 | -781 | | -1,227 | -1,640 | |
| සංචාරක ඉපැයීම් | 9 (ආ) | 174 (ඇ) | - | 13 (ආ) | 322 (ඇ) | - |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 580 | 205 | -64.6 | 1,255 | 464 | -63.0 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -26 | 49 | | -70 | 85 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 126 | 140 | | 190 | 271 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | ... | - | | 3 | 5 | |
| දිගුකාලීන ණය | 126 | 140 | | 187 | 266 | |
| සමස්ත ශේෂය | | | | -774 | -1,697 | |

**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2021 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2022 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.
(ඈ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත් වේ.
... සැලකිය යුතු නොවේ

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් ‘මාසික වෙළඳ විවරණිකාව’ ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

## වෙළඳ භාණ්ඩ ශේෂය සහ වෙළඳ මිල අනුපාතය

**වෙළඳ ශේෂය:** වෙළඳ ගිණුමේ හිඟය, 2021 වසරේ පෙබරවාරි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 572ට සාපේක්ෂව, 2022 වසරේ පෙබරවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 781ක් දක්වා පුළුල් විය. කෙසේ වෙතත්, මාසික ලක්ෂ්‍යමය පදනම මත 2022 වසරේ ජනවාරි මාසය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් 859ක හිඟයට සාපේක්ෂව 2022 වසරේ පෙබරවාරි මාසයේ වෙළඳ හිඟය පහළ ගියේය. මේ අතර, 2022 වසරේ ජනවාරි සිට පෙබරවාරි දක්වා කාලපරිච්ඡේදය තුළ වෙළඳ ගිණුමේ සමස්ත හිඟය, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,227ක හිඟයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,640ක් දක්වා පුළුල් විය. වෙළඳ ගිණුමේ සමස්ත හිඟය පුළුල් වීම සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූප සටහන 1 මගින් දැක්වේ.

**වෙළඳ මිල අනුපාතය:** අපනයන සහ ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන වෙළඳ මිල අනුපාතය, 2021 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව 2022 වසරේ පෙබරවාරි මාසයේ දී සියයට 10.7කින් පහළ ගිය අතර, අපනයන මිල ගණන් ඉහළ යෑමට වඩා වැඩි වේගයකින් ආනයන මිල ගණන් ඉහළ යෑම මේ සඳහා හේතු විය.

**රූප සටහන 1: 2022 වසරේ ජනවාරි - පෙබරවාරි කාලපරිච්ඡේදය තුළ වෙළඳ හිඟය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ඉහළ යෑම සඳහා දායක වූ ප්‍රධාන අයිතම (අගය එ.ජ. ඩොලර් මිලියනවලින්)**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2021-2022)**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2021-2022)**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය**[1]

**සමස්ත අපනයන: 2022 වසරේ පෙබරවාරි මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම, 2021 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,092ක් දක්වා සියයට 14.7කින් වර්ධනය විය.** කාර්මික අපනයන සහ ඛනිජමය අපනයන ඉපැයීම්වල වර්ධනයක් දක්නට ලැබුණු අතර, කෘෂිකාර්මික අපනයනවල පහළ යෑමක් දක්නට ලැබුණි. සමස්ත අපනයන ආදායම, පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ පැවති එ.ජ. ඩොලර් මිලියන 2,192ට සාපේක්ෂව, 2022 වසරේ ජනවාරි සිට පෙබරවාරි දක්වා කාලපරිච්ඡේදය තුළ දී සියයට 16.1කින් ඉහළ ගියේය.

**කාර්මික අපනයන:** කාර්මික භාණ්ඩ අපනයන ආදායම, 2021 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව 2022 වසරේ පෙබරවාරි මාසයේ දී සියයට 19.4කින් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන්, ඇඟලුම් හා ඛනිජ තෙල් නිෂ්පාදිත ඇතුළු බොහෝ කාර්මික නිෂ්පාදිත කාණ්ඩවල ඉපැයීම් සමස්තයක් ලෙස ඉහළ යෑම මෙයට හේතු විය. සියලුම ප්‍රධාන වෙළඳපොළ වෙත සිදු කළ ඇඟලුම් අපනයන වර්ධනය විය. ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනවලින් ලැබෙන ඉපැයීම් ඉහළ යෑම සඳහා නැව් සහ ගුවන්යානා සඳහා යොදාගනු ලබන ඉන්ධන අපනයනවල මිල ගණන් සහ පරිමාවන් ඉහළ යෑම හේතු විය. තවද, ආහාර, පාන වර්ග සහ දුම්කොළ (ප්‍රධාන වශයෙන්, සකස් කළ දුම්කොළ, චොකලට් සහ දියරමය පොල් කිරි), මූල ලෝහ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, උපකරණ, ඇලුමිනියම් ආකෘතීන්), රබර් නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, ඝන ටයර් සහ ශල්‍යකර්ම සිදුකිරීමට යොදා ගන්නා රබර් අත්වැසුම්), මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ, යන්ත්‍රසූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ (ප්‍රධාන වශයෙන්, යාන්ත්‍රික උපකරණ කොටස් සහ විද්‍යුත් සන්නායක) අපනයනවල සැලකිය යුතු වර්ධනයක් වාර්තා විය. කෙසේ වෙතත්, සකසන ලද රෙදිපිළි උපාංග යටතේ වර්ග කරන ලද මුහුණු ආවරණ, ප්ලාස්ටික් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත යටතේ වර්ග කරන ලද ප්ලාස්ටික් රෙදිපිළි උපාංග වැනි පුද්ගලික සනීපාරක්ෂක උපකරණ කාණ්ඩවලින් ලද ආදායම සුළු වශයෙන් පහළ යෑමක් වාර්තා කල අතර, එමගින් එවැනි භාණ්ඩ සඳහා වන ඉල්ලුම පහත වැටීම පිළිබිඹු කරයි.

**කෘෂිකාර්මික අපනයන:** කෘෂිකාර්මික භාණ්ඩ අපනයනවලින් ලද සමස්ත අපනයන ආදායම, 2021 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව, 2022 වසරේ පෙබරවාරි මාසයේ දී සියයට 2.1කින් පහළ ගිය අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන්, තේ, කුළුබඩු සහ සකස්නොකළ දුම්කොළ අපනයන ආදායම පහළ යෑම හේතු විය. තේ අපනයන ආදායම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 10.4 කින් පහත වැටීම සඳහා ප්‍රධාන වශයෙන් අපනයන පරිමාවන් පහළ යෑම හේතු වූ අතර (සියයට 9.1කින් අඩු වීම) අපනයන මිල ගණන් වල සාමාන්‍ය (සියයට 1.4කින් අඩු වීම) පහළ යෑම ද මෙම අඩු වීම සඳහා යම්තාක් දුරකට හේතු විය. කරාබු නැටි, කුරුඳු සහ සාදික්කා අපනයන පරිමාව අඩුවීම හේතුවෙන් 2022 වසරේ පෙබරවාරි මාසයේ දී කුළුබඩු අපනයන ඉපැයීම් සියයට 18.3කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) පහළ ගියේය. අයහපත් කාලගුණික තත්ත්වය සහ රසායනික පොහොර හිඟය කෘෂිකාර්මික නිෂ්පාදන අපනයන පරිමාවන්හි පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, පෙර වසරට සාපේක්ෂව මුහුදු ආහාර (ප්‍රධාන වශයෙන්, නැවුම් සහ ශීත කළ කෙළවල්ලන්), පොල් (ප්‍රධාන වශයෙන්, පොල් කෙඳි සහ දිසිදි පොල්), ස්වභාවික රබර්, සුළු

[1] සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය (සිව්වන සංස්කරණය) පදනම් කර ගත් අපනයන සංයුතිය ඇමුණුම Iහි දක්වා ඇත.

කෘෂිකාර්මික නිෂ්පාදිත සහ එළවළු යන අපනයන උප කාණ්ඩ පෙර වසරට සාපේක්ෂව 2022 වසරේ පෙබරවාරි මාසයේ දී ඉහළ යෑම් වාර්තා කළේය.

**ඛනිජ අපනයන:** 2022 වසරේ පෙබරවාරි මාසයේ දී ක්වාට්ස්, ටයිටේනියම් ලෝපස් සහ ග්‍රැනයිට් වැනි ඛනිජවලින් ලද අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් ඛනිජ අපනයන ආදායම, 2021 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව සියයට 12.7කින් ඉහළ ගියේය.

**අපනයන දර්ශක:** අපනයන ආදායම ඉහළ යෑම සඳහා අපනයන පරිමාවන් වැඩි වශයෙන් හේතු වූ බව නිරූපණය කරමින්, 2022 වසරේ පෙබරවාරි මාසයේ දී වාර්ෂික ලක්ෂයමය පදනම මත, අපනයන පරිමා සහ ඒකක මිල දර්ශක පිළිවෙළින්, සියයට 11.2කින් (ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන හේතුවෙන්) සහ සියයට 3.1කින් ඉහළ ගියේය.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: මාසික අපනයන පරිමා දර්ශකය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 6: මාසික අපනයන ඒකක මිල දර්ශකය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | 2021 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | 2022 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2021 ජන.-පෙබ. (එ.ජ.ඩො. මිලියන) | 2022 ජන.-පෙබ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **740.3** | **883.7** | **19.4** | **1,472.6** | **1,773.9** | **20.5** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 41.7 | 50.4 | 21.0 | 81.4 | 92.1 | 13.2 |
| සත්ත්ව ආහාර | 8.6 | 12.0 | 39.8 | 20.5 | 24.8 | 20.8 |
| රෙදිපිළි හා ඇඟලුම් | 443.3 | 496.4 | 12.0 | 866.3 | 1,012.5 | 16.9 |
| එයින්, ඇඟලුම් | 408.4 | 456.7 | 11.8 | 793.9 | 935.6 | 17.9 |
| රෙදිපිළි | 22.8 | 27.7 | 21.5 | 47.4 | 55.4 | 16.9 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 12.1 | 12.0 | -0.9 | 25.0 | 21.5 | -14.3 |
| රබර් නිෂ්පාදිත | 81.0 | 88.3 | 9.1 | 161.2 | 170.3 | 5.7 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 19.7 | 25.2 | 28.0 | 43.1 | 55.3 | 28.5 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 39.6 | 44.8 | 13.2 | 80.7 | 89.5 | 10.8 |
| ප්‍රවාහන උපකරණ | 9.0 | 11.3 | 25.1 | 15.8 | 20.2 | 27.6 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 22.7 | 56.8 | 150.6 | 57.1 | 124.0 | 117.2 |
| රසායනික නිෂ්පාදිත | 15.3 | 15.5 | 1.1 | 32.4 | 33.3 | 2.8 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 9.9 | 13.0 | 31.1 | 18.9 | 24.7 | 30.9 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 2.8 | 6.9 | 146.1 | 3.7 | 11.1 | 204.3 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 4.5 | 5.9 | 31.4 | 7.9 | 10.1 | 27.4 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.6 | 6.6 | -0.1 | 11.8 | 12.9 | 8.7 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 9.0 | 17.4 | 93.7 | 19.1 | 31.6 | 65.1 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 2.9 | 3.1 | 7.7 | 5.6 | 5.7 | 1.0 |
| වෙනත් කාර්මික අපනයන | 23.9 | 30.2 | 26.2 | 47.0 | 55.8 | 18.6 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **206.5** | **202.1** | **-2.1** | **406.5** | **406.6** | **...** |
| තේ | 112.5 | 100.9 | -10.4 | 213.5 | 192.1 | -10.0 |
| රබර් | 2.7 | 4.9 | 78.0 | 6.7 | 9.9 | 49.3 |
| පොල් | 30.9 | 34.7 | 12.2 | 55.1 | 68.0 | 23.5 |
| කුළුබඩු | 33.1 | 27.1 | -18.3 | 75.2 | 62.1 | -17.4 |
| එළවළු | 1.5 | 1.6 | 6.7 | 3.2 | 3.9 | 21.6 |
| සකස් නොකළ දුම්කොළ | 2.4 | 2.1 | -13.9 | 4.6 | 4.4 | -5.4 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 9.2 | 9.8 | 5.7 | 17.3 | 21.0 | 21.2 |
| මුහුදු ආහාර | 14.1 | 21.2 | 50.5 | 31.0 | 45.3 | 46.2 |
| **3. ඛනිජ අපනයන** | **3.6** | **4.1** | **12.7** | **7.1** | **8.4** | **18.2** |
| **4. වර්ග නොකළ අපනයන** | **1.3** | **1.7** | **33.0** | **2.2** | **3.5** | **58.3** |
| **මුළු අපනයන** | **951.7** | **1,091.6** | **14.7** | **1,888.4** | **2,192.4** | **16.1** |

(අ) තාවකාලික
... සැලකිය යුතු නොවේ

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය[2]

**සමස්ත ආනයන: 2022 වසරේ පෙබරවාරි මාසයේ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම, 2021 වසරේ දෙසැම්බර් සහ 2022 වසරේ ජනවාරි මාසවලට සාපේක්ෂව පහළ යෑමක් වාර්තා කළ ද, 2021 වසරේ පෙබරවාරි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,524 හා සැසඳීමේ දී, එ.ජ. ඩොලර් මිලියන 1,873ක් දක්වා සියයට 22.9කින් ඉහළ ගියේය.** සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන වියදම්වල කැපී පෙනෙන වැඩිවීමක් දක්නට ලැබුණු අතර, එම ඉහළ යෑම සඳහා අන්තර් භාණ්ඩ ආනයන ප්‍රධාන වශයෙන් හේතු විය. සමුච්චිත පදනම මත, 2022 වසරේ ජනවාරි සිට පෙබරවාරි දක්වා කාලපරිච්ඡේදය තුළ මුළු ආනයන වියදම, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,115ට සාපේක්ෂව සියයට 23.0ක ඉහළ යෑමක් වාර්තා කරමින් එ.ජ. ඩොලර් මිලියන 3,832ක් ලෙස වාර්තා විය.

**පාරිභෝගික භාණ්ඩ:** ආහාර නොවන පාරිභෝගික භාණ්ඩවල ආනයන වියදම පහළ ගිය ද, 2021 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව 2022 වසරේ පෙබරවාරි මාසයේ දී ආහාර සහ පාන වර්ග සඳහා වූ වියදම් ඉහළ යෑම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩවල ආනයන වියදම 9.5කින් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන්, ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, සහල්) ආනයනය හේතුවෙන් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ආහාර සහ පාන වර්ග ආනයන වියදම සියයට 22.5කින් ඉහළ ගියේය. තවද, කුළුබඩු (ප්‍රධාන වශයෙන්, මිරිස්), එළවළු (ප්‍රධාන වශයෙන්, ලොකු ළූණු සහ අර්තාපල්), මුහුදු ආහාර (ප්‍රධාන වශයෙන්, කරවල) සහ පාන වර්ගවල ආනයන වියදම්වල වැඩි වීමක් දක්නට ලැබුණු අතර, ආනයන පරිමාවන් අඩුවීම හේතුවෙන් තෙල් සහ මේද වර්ග (ප්‍රධාන වශයෙන්, පොල් තෙල්), සීනි සහ කිරි නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, කිරිපිටි) ආනයන වියදම පහළ ගියේය. මේ අතර, විදුලි සංදේශ උපකරණ (ප්‍රධාන වශයෙන්, ජංගම දුරකථන) ආනයන අඩු වීම හේතුවෙන් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන සියයට 2.5කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) පහළ ගියේය. 2022 වසරේ පෙබරවාරි මාසයේ දී රබර් නිෂ්පාදිත සහ පුද්ගලික භාවිතය සඳහා වූ වාහන ආනයනය ද 2021 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව පහළ ගියේය. කෙසේ වෙතත්, 2021 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව 2022 වසරේ පෙබරවාරි මාසයේ දී රෙදිපිළි හා උපාංග, ගෘහ හා දැව භාණ්ඩ, සහ බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, විටමින් වර්ග) ආනයන ඉහළ යෑම් වාර්තා විය.

**අන්තර් භාණ්ඩ:** ප්‍රධාන වශයෙන්, ඉන්ධන, රෙදිපිළි සහ රෙදිපිළි උපාංග (ප්‍රධාන වශයෙන්, රෙදි), මූල ලෝහ (ප්‍රධාන වශයෙන්, යකඩ හා වානේ), සහ රසායනික නිෂ්පාදිත හේතුවෙන් 2022 වසරේ පෙබරවාරි මාසයේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 29.0කින් ඉහළ ගියේය. පිරිපහදු කළ ඛනිජ තෙල් (එල්.පී. ගෑස් ඇතුළුව) සහ බොරතෙල් ආනයන පරිමාවන් අඩු වීම මධ්‍යයේ වුවද, බොරතෙල්, පිරිපහදු කළ ඛනිජ තෙල් සහ ගල් අඟුරු ආනයන මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් 2022 වසරේ පෙබරවාරි මාසයේ දී ඉන්ධන ආනයන වියදම සියයට 44.4කින් ඉහළ ගියේය. බොරතෙල් බැරලයක් සඳහා සාමාන්‍ය ආනයන මිල, 2021 වසරේ පෙබරවාරි මාසයේ දී වූ එ.ජ. ඩොලර් 64.07ට සාපේක්ෂව 2022 වසරේ පෙබරවාරි මාසයේ දී එ.ජ. ඩොලර් 76.41ක් විය. මේ අතර, ප්‍රධාන වශයෙන් ආනයන පරිමාවන්

[2] සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය (සිව්වන සංස්කරණය) පදනම් කර ගත් ආනයන සංයුතිය ඇමුණුම IIහි දක්වා ඇත.

.

අඩුවීම හේතුවෙන් 2021 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව 2022 වසරේ පෙබරවාරි මාසයේ දී, තිරිඟු, ආහාර සැකසුම් (ප්‍රධාන වශයෙන්, පාම් තෙල්), පොහොර සහ රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම පහළ ගියේය.

**ආයෝජන භාණ්ඩ:** යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍යවල සැලකිය යුතු වර්ධනය හේතුවෙන් 2022 වසරේ පෙබරවාරි මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම, 2021 වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 16.4කින් ඉහළ ගියේය. යන්ත්‍රසූත්‍ර සහ උපකරණ කොටස්, ඉලෙක්ට්‍රොනික හා ඉංජිනේරු උපකරණ ආනයන ඉහළ යෑම හේතුවෙන් යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ආනයන ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් යකඩ, වානේ සහ ඒ ආශ්‍රිත උපාංග සහ සිමෙන්ති හේතුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම ඉහළ ගියේය. ටැංකි හා බවුසර් ආනයන අඩු වීම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයන වියදම පහළ ගියේය.

**ආනයන දර්ශක:** 2022 වසරේ පෙබරවාරි මාසයේ දී, ආනයන වියදම ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් ඒකක වටිනාකමේ බලපෑම හේතු වූ බව නිරූපණය කරමින්, 2022 වසරේ පෙබරවාරි මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ආනයන පරිමා සහ ඒකක මිල දර්ශක, පිළිවෙළින්, සියයට 6.4කින් සහ සියයට 15.5කින් ඉහළ ගියේය.

**රූප සටහන 7: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 8: මාසික ආනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 9: මාසික ආනයන ඒකක මිල දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)**

| කාණ්ඩය | 2021 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | 2022 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2021 ජන.-පෙබ. (එ.ජ.ඩො. මිලියන) | 2022 ජන.-පෙබ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **272.7** | **298.8** | **9.5** | **618.3** | **658.8** | **6.5** |
| ආහාර හා පාන වර්ග | 131.8 | 161.4 | 22.5 | 315.6 | 348.6 | 10.5 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 2.9 | 41.7 | 1,320.4 | 6.7 | 102.2 | 1,420.3 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 31.7 | 23.6 | -25.6 | 54.8 | 53.5 | -2.4 |
| එළවළු (ආ) | 27.2 | 33.0 | 21.2 | 67.6 | 62.6 | -7.5 |
| මුහුදු ආහාර | 5.4 | 8.1 | 49.0 | 17.5 | 16.5 | -5.7 |
| සීනි හා රසකැවිලි | 29.1 | 17.7 | -39.1 | 86.6 | 43.8 | -49.5 |
| කුළුබඩු | 6.2 | 15.0 | 141.9 | 18.7 | 26.9 | 43.3 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 29.3 | 22.4 | -23.4 | 63.6 | 43.2 | -32.0 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 140.9 | 137.3 | -2.5 | 302.7 | 310.2 | 2.5 |
| පෞද්ගලික රථවාහන | 0.9 | 0.7 | -23.2 | 1.4 | 1.4 | -2.7 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 41.2 | 44.5 | 8.1 | 86.0 | 123.4 | 43.5 |
| ගෘහ උපකරණ | 17.5 | 17.8 | 1.6 | 39.4 | 34.1 | -13.5 |
| රෙදිපිළි හා උපාංග | 17.4 | 25.7 | 47.4 | 35.9 | 48.6 | 35.1 |
| විදුලි සංදේශ උපකරණ | 30.8 | 8.6 | -72.2 | 69.2 | 25.3 | -63.4 |
| ගෘහ හා දැව භාණ්ඩ | 13.8 | 20.7 | 49.6 | 29.5 | 36.0 | 22.3 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 19.3 | 19.4 | 0.6 | 41.2 | 41.4 | 0.4 |
| **2. අන්තර් භාණ්ඩ** | **945.9** | **1,219.8** | **29.0** | **1,860.8** | **2,432.3** | **30.7** |
| ඉන්ධන | 320.2 | 462.2 | 44.4 | 630.0 | 892.5 | 41.7 |
| එයින්, බොරතෙල් | 44.9 | 51.6 | 14.9 | 127.1 | 110.1 | -13.4 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 246.5 | 338.8 | 37.5 | 443.0 | 650.0 | 46.7 |
| ගල්අඟුරු | 28.8 | 71.8 | 149.4 | 59.9 | 132.4 | 120.9 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 12.1 | 12.5 | 3.0 | 23.1 | 26.5 | 14.4 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 222.8 | 323.1 | 45.1 | 459.2 | 639.7 | 39.3 |
| කඩදාසි හා ඝන කඩදාසි | 31.9 | 40.3 | 26.5 | 63.1 | 81.6 | 29.3 |
| කෘෂිකාර්මික යෙදවුම් | 19.3 | 18.1 | -6.6 | 42.5 | 35.0 | -17.6 |
| තිරිඟු හා ඉරිඟු | 55.5 | 15.8 | -71.5 | 62.4 | 57.5 | -7.8 |
| මූල ලෝහ | 28.2 | 71.5 | 153.9 | 66.9 | 146.4 | 118.8 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 57.8 | 66.8 | 15.6 | 117.1 | 143.9 | 22.9 |
| රසායනික නිෂ්පාදිත | 77.4 | 92.4 | 19.3 | 165.5 | 179.2 | 8.3 |
| පොහොර | 14.0 | 4.2 | -70.2 | 18.7 | 6.7 | -64.4 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 34.4 | 33.4 | -2.9 | 60.5 | 67.2 | 11.1 |
| ඛනිජ නිෂ්පාදිත | 7.5 | 12.4 | 64.9 | 19.8 | 29.0 | 46.3 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 64.8 | 67.2 | 3.6 | 131.9 | 127.2 | -3.6 |
| **3. ආයෝජන භාණ්ඩ** | **303.7** | **353.6** | **16.4** | **633.8** | **740.3** | **16.8** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 193.8 | 224.3 | 15.7 | 410.5 | 468.1 | 14.0 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 89.2 | 115.5 | 29.5 | 176.9 | 239.5 | 35.4 |
| ප්‍රවාහන උපකරණ | 20.6 | 13.1 | -36.2 | 46.1 | 31.8 | -31.0 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.1 | 0.7 | 529.2 | 0.3 | 1.0 | 233.4 |
| **4. වර්ග නොකළ ආනයන** | **1.3** | **0.8** | **-41.0** | **2.3** | **0.9** | **-60.9** |
| **මුළු ආනයන** | **1,523.6** | **1,872.9** | **22.9** | **3,115.2** | **3,832.3** | **23.0** |
| **එයින් ඉන්ධන නොවන ආනයන** | **1,203.4** | **1,410.8** | **17.2** | **2,485.2** | **2,939.9** | **18.3** |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ:** 2022 වසරේ ජනවාරි මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 259ක් සහ පෙර වසරේ පෙබරවාරි මාසය තුළ වූ එ.ජ. ඩොලර් මිලියන 580ට සාපේක්ෂව 2022 වසරේ පෙබරවාරි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 205ක් විය. ප්‍රධාන වශයෙන් නුපුහුණු (6,548), ගෘහ සේවිකා (6,451) සහ පුහුණු (6,294) යන කාණ්ඩ වල දායකත්වයෙන්, 2022 වසරේ පෙබරවාරි මාසය තුළ දී විදේශ රැකියා සඳහා පිටත්ව යෑමේ සමස්තය 22,074ක් ලෙස වාර්තා විය.

**සංචාරක පැමිණීම්:** 2022 වසරේ ජනවාරි මාසයේ වාර්තා වූ 82,327ක සංචාරක පැමිණීම් ප්‍රමාණයට සාපේක්ෂව, 2022 වසරේ පෙබරවාරි මාසයේ දී පැමිණි සංචාරකයන් ප්‍රමාණය 96,507ක් ලෙස වාර්තා විය. 2022 වසරේ පෙබරවාරි මාසය තුළ වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් පැමිණි රටවල් ලෙස රුසියාව, ඉන්දියාව, එක්සත් රාජධානිය, ජර්මනිය, සහ ප්‍රංශය පැවතුණි. 2022 වසරේ ජනවාරි මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 148ක් සහ පෙර වසරේ පෙබරවාරි මාසය තුළ වූ එ.ජ. ඩොලර් මිලියන 9ට සාපේක්ෂව 2022 වසරේ පෙබරවාරි මාසයේ දී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 174ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත.

**රූප සටහන 10: මාසික සංචාරක පැමිණීම්**




**මූලය:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 11: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




**මූලයන්:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූලය ලැබීම්

2022 වසරේ පෙබරවාරි මාසය තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජකයින් සම්බන්ධ ගනුදෙනු කිසිවක් සිදු වී නොමැත. 2022 වසරේ පෙබරවාරි මාසය දක්වා වූ මාස දෙක තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 4ක සමස්ත ශුද්ධ ලැබීමක් වාර්තා වූ අතර, නොපියවා ඉතිරිව ඇති විදේශීය ආයෝජන ප්‍රමාණය 2022 වසරේ පෙබරවාරි මාසය අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 13ක් ලෙස අඩු මට්ටමක පැවතුණි. මේ අතර, ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළුව, 2022 වසරේ පෙබරවාරි මාසයේ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙත එ.ජ. ඩොලර් මිලියන 49ක ශුද්ධ ලැබීමක් සිදු විය. සමුච්චිත පදනම මත, 2022 වසරේ පෙබරවාරි මාසයෙන් අවසන් වූ මාස දෙක තුළ දී ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළුව, කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 85ක ශුද්ධ ලැබීමක් වාර්තා විය.

## ජාත්‍යන්තර සංචිත

2022 වසරේ පෙබරවාරි මාසය අවසන් වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 2.3ක් විය. චීන මහජන බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් බිලියන 1.5කට සමාන විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වූ අතර, එය භාවිතා කිරීම යම් කොන්දේසි වලට යටත් වේ. දළ නිල සංචිත හා බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2022 වසරේ පෙබරවාරි මාසය අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 5.6ක් විය.

**රූප සටහන 12: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයෙහි හැසිරීම

**2022 වසරේ මාර්තු මස මුල සිට විනිමය අනුපාතිකයේ කැපී පෙනෙන අවප්‍රමාණය වීමක් නිරීක්ෂණය කරන ලදී.** 2022 වසරේ මාර්තු මස මුල දක්වා එ.ජ. ඩොලරයට ශ්‍රී ලංකා රුපියල් 202-203ක්ව පැවති විනිමය අනුපාතිකයට, 2022 වසරේ මාර්තු මස මුල් සතියේ දී විනිමය අනුපාතිකය තීරණය කිරීමේ දී ක්‍රමානුකූල ගැලපීමක් සඳහා ඉඩ හරිනලදී. කෙසේ වෙතත්, දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ඉහළ පීඩනය හේතුවෙන් ඇති වූ වෙළඳපළ ගැලපීම නිසා විනිමය අනුපාතිකය ඉහළ ප්‍රමාණයකින් අවප්‍රමාණය විය. ඒ අනුව, 2022 වසරේ මැයි 12 දක්වා වූ කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 44.3ක අවප්‍රමාණය වීමක් වාර්තා කළේය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, 2022 වසරේ මැයි 12වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, යූරෝ, ස්ටර්ලින් පවුම, ජපන් යෙන්, ඉන්දියානු රුපියල සහ ඕස්ට්‍රේලියානු ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය විය.

**රූප සටහන 13: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි වෙනස් වීම**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස් වීම**

| මුදල් ඒකකය | 2020 | 2021 | 2022 (මැයි 12 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -2.6% | -7.0% | -44.3% |
| යූරෝ | -11.2% | +1.1% | -40.1% |
| ස්ටර්ලින් පවුම | -6.2% | -6.0% | -38.6% |
| ජපන් යෙන් | -7.5% | +3.8% | -37.2% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -11.4% | -1.2% | -41.8% |
| ඉන්දියානු රුපියල | 0.0% | -5.5% | -42.1% |

**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**ඇමුණුම I:**

**සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව අපනයන සංයුතිය (අ)**

| කාණ්ඩය | 2021 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | 2022 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2021 ජන.-පෙබ. (එ.ජ.ඩො. මිලියන) | 2022 ජන.-පෙබ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **209.9** | **213.2** | **1.6** | **419.1** | **429.0** | **2.4** |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 16.6 | 24.0 | 43.9 | 35.9 | 51.1 | 42.4 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 6.7 | 5.7 | -15.2 | 12.4 | 11.5 | -7.7 |
| 05 එළවළු හා පලතුරු | 32.1 | 34.4 | 7.4 | 59.7 | 73.5 | 23.2 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 141.4 | 127.8 | -9.6 | 281.7 | 253.6 | -10.0 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **9.3** | **12.3** | **32.3** | **19.8** | **21.0** | **6.3** |
| 11 පාන වර්ග | 2.0 | 3.4 | 68.5 | 4.7 | 5.8 | 22.3 |
| 12 දුම්කොළ හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදිත | 7.3 | 8.9 | 22.3 | 15.1 | 15.3 | 1.3 |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **32.9** | **42.3** | **28.8** | **63.9** | **80.4** | **25.8** |
| 23 සකස් නොකළ රබර් | 2.8 | 5.0 | 78.5 | 6.8 | 10.2 | 49.5 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 19.2 | 22.9 | 18.8 | 36.0 | 41.6 | 15.5 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **22.7** | **56.8** | **150.6** | **57.1** | **124.0** | **117.2** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 22.7 | 56.8 | 150.6 | 57.1 | 108.1 | 89.4 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | - | - | - | - | 15.9 | - |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **10.1** | **9.1** | **-9.8** | **17.2** | **16.0** | **-7.3** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 5.8 | 5.3 | -8.1 | 10.0 | 10.9 | 8.6 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **21.2** | **19.4** | **-8.4** | **42.8** | **40.2** | **-6.0** |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **123.3** | **151.0** | **22.5** | **254.9** | **295.3** | **15.8** |
| 62 රබර් නිෂ්පාදන (අන් තැනක සඳහන් නොවන) | 51.5 | 61.0 | 18.5 | 104.2 | 114.8 | 10.2 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 32.9 | 36.7 | 11.7 | 68.0 | 72.9 | 7.3 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 24.5 | 30.1 | 23.1 | 53.2 | 64.7 | 21.7 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **47.2** | **54.7** | **15.8** | **94.1** | **106.9** | **13.6** |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් (අන් තැනක සඳහන් නොවන) | 26.2 | 28.2 | 7.7 | 48.6 | 55.6 | 14.4 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **475.2** | **532.7** | **12.1** | **919.3** | **1,079.7** | **17.5** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 440.8 | 486.7 | 10.4 | 856.4 | 997.4 | 16.5 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **-** | **...** | **-** | **0.2** | **...** | **-99.7** |
| **මුළු අපනයන** | **951.7** | **1,091.6** | **14.7** | **1,888.4** | **2,192.4** | **16.1** |

(අ) තාවකාලික
... සැලකිය යුතු නොවේ

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017 හි විශේෂ සටහන 04 බලන්න.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf

**ඇමුණුම II:**

## සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව ආනයන සංයුතිය (අ)

| කාණ්ඩය | 2021 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | 2022 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2021 ජන.- පෙබ. (එ.ජ.ඩො. මිලියන) | 2022 ජන.-පෙබ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **195.1** | **195.6** | **0.2** | **396.5** | **444.3** | **12.0** |
| 02 කිරි ආශ්‍රිත නිෂ්පාදිත හා කුරුලු බිත්තර | 31.7 | 23.6 | -25.6 | 54.9 | 53.5 | -2.5 |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 5.6 | 8.2 | 47.4 | 17.7 | 16.8 | -5.6 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 58.3 | 57.0 | -2.2 | 68.6 | 159.0 | 131.8 |
| 05 එළවළු හා පලතුරු | 33.1 | 40.1 | 21.2 | 79.7 | 76.5 | -4.1 |
| 06 සීනි, සීනි ආශ්‍රිත සැකසුම් හා පැණි | 29.1 | 17.7 | -39.1 | 86.6 | 43.8 | -49.4 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 9.2 | 19.3 | 109.0 | 25.3 | 35.8 | 41.6 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **5.0** | **9.5** | **87.8** | **12.1** | **17.3** | **42.8** |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **45.8** | **46.6** | **1.8** | **86.1** | **95.7** | **11.1** |
| 23 සකස් නොකළ රබර් | 30.7 | 27.8 | -9.5 | 52.9 | 56.0 | 5.9 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 0.9 | 3.5 | 290.3 | 2.8 | 5.3 | 88.5 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **320.2** | **462.2** | **44.4** | **630.0** | **892.5** | **41.7** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 265.6 | 375.9 | 41.5 | 526.7 | 713.4 | 35.4 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | 25.8 | 14.4 | -44.0 | 43.4 | 46.7 | 7.7 |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **34.3** | **9.2** | **-73.1** | **67.7** | **17.1** | **-74.8** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 32.7 | 7.4 | -77.5 | 64.3 | 13.1 | -79.6 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **185.7** | **206.9** | **11.5** | **381.0** | **453.8** | **19.1** |
| 54 බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 36.8 | 41.0 | 11.5 | 75.5 | 116.4 | 54.2 |
| 56 පොහොර | 14.0 | 4.2 | -70.1 | 18.7 | 6.7 | -64.3 |
| 57 ප්‍රාථමික ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 41.6 | 47.6 | 14.4 | 83.2 | 105.1 | 26.2 |
| 58 ප්‍රාථමික නොවන ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 12.7 | 17.0 | 34.4 | 28.3 | 35.8 | 26.4 |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **399.2** | **583.0** | **46.0** | **820.3** | **1,170.5** | **42.7** |
| 64 කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 30.2 | 38.9 | 29.1 | 60.6 | 76.4 | 26.1 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 220.3 | 318.8 | 44.7 | 454.2 | 627.3 | 38.1 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 37.3 | 48.6 | 30.5 | 78.0 | 103.6 | 32.8 |
| 67 යකඩ හා වානේ | 40.2 | 96.5 | 140.4 | 84.0 | 192.8 | 129.7 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **265.5** | **272.8** | **2.7** | **572.5** | **567.2** | **-0.9** |
| 72 ඇතැම් කර්මාන්ත සඳහා විශේෂයෙන් සකස් කරන ලද යන්ත්‍රසූත්‍ර | 45.8 | 56.2 | 22.8 | 98.8 | 112.8 | 14.2 |
| 74 සාමාන්‍ය කාර්මික යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ යන්ත්‍ර කොටස් (අන් තැනක සඳහන් නොවන) | 49.4 | 58.7 | 18.9 | 100.8 | 104.8 | 3.9 |
| 75 කාර්යාලයීය යන්ත්‍රසූත්‍ර හා ස්වයංක්‍රීය දත්ත සැකසුම් යන්ත්‍ර | 23.3 | 20.5 | -12.0 | 49.3 | 49.6 | 0.5 |
| 76 විදුලි සන්දේශ සහ ශබ්ද පටිගත කිරීම හා ප්‍රතිනිෂ්පාදන කටයුතු සඳහා යොදාගනු ලබන උපකරණ | 55.5 | 27.2 | -51.0 | 123.6 | 65.8 | -46.8 |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග (අන් තැනක සඳහන් නොවන) සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් | 47.2 | 72.2 | 52.9 | 109.4 | 134.4 | 22.9 |
| 78 රථවාහන | 24.8 | 17.2 | -30.5 | 55.5 | 38.1 | -31.3 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **71.4** | **86.6** | **21.3** | **146.4** | **173.1** | **18.2** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 15.0 | 21.5 | 43.8 | 29.5 | 40.9 | 38.7 |
| 87 වෘත්තීමය, විද්‍යාත්මක හා පාලන මෙවලම් සහ උපකරණ (අන් තැනක සඳහන් නොවන) | 16.9 | 17.4 | 3.0 | 34.3 | 33.1 | -3.4 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **1.3** | **0.7** | **-50.5** | **2.5** | **1.0** | **-59.1** |
| **මුළු ආනයන** | **1,523.6** | **1,872.9** | **22.9** | **3,115.2** | **3,832.3** | **23.0** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව
සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017හි විශේෂ සටහන 04 බලන්න.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf